// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1761/3 - 2012 ජුනි 05 වැනි අඟහරුවාදා - 2012.06.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තිය

බස්නාහිර පළාත් සභාව විසින් 2011 ඔක්තෝබර් මස 10 වැනි දින අනුමත කරනු ලදුව බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2012 මැයි මස 14 වැනි දින අනුඥාව ලබා දී ඇති බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තිය 2012 මැයි මස 14 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු බව බස්නාහිර පළාත් සභාවේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදාහැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය හේවා මාතරගේ උපාලි කොඩිකාර වන මම මෙයින් නියම කරමි.

හේවා මාතරගේ උපාලි කොඩිකාර,
බස්නාහිර පළාත්, ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු,
සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන,
ආහාර සැපයීම් හා බෙදාහැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍ය.

2012 ක් වූ මැයි මස 22 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ,
අංක 204 දරන ස්ථානයේ පිහිටි
බස්නාහිර පළාත්, ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු,
සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන,
ආහාර සැපයීම් හා බෙදාහැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය.

**බස්නාහිර පළාත් සභාවේ**

***2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තිය***

1998 අංක 03 දරන බස්නාහිර පළාතේ සමුපකාර සමිති ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1A - PG 001360— 835 (2012/06)

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

01. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2011 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලැබීමෙන් පසු ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

පූර්විකාව සංශෝධනය කිරීම

02. මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියෙහි පූර්විකාවෙහි "සංශෝධන පනත් හා නොසැසඳේ" යන වචන වෙනුවට "පනතට අනනුකූල වන්නේ ය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වැනි වගන්තිය සංශෝධනය කිරීම

03. ප්‍රධාන ප්‍රඥප්තියේ 02 වැනි වගන්තියේ (4) වැනි උප වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අළුත් උප වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම උප වගන්තිය (5) වැනි උප වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

"(5) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන්නා වූ ද සමුපකාර සමිති පරීක්ෂකවරයෙකුට/සමුපකාර සංවර්ධන නිලධාරිවරයකුට හෝ එකී නිලයට පහළ නොවූ නිල දරන්නාවූ තැනැත්තන් හට එකී විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ බලය සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් විසින් පවරනු ලැබිය හැකි ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වැනි වගන්තිය සංශෝධනය කිරීම

04. ප්‍රධාන ප්‍රඥප්තියේ 03 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) ප්‍රධාන ප්‍රඥප්තියේ 3(1) උප වගන්තියේ (අ) සහ (ආ) ඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අළුත් ඡේද ආදේශ කිරීමෙන් ඒ ඡේද මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(අ) සමිතියේ සාමාජිකයින්ගේ ආර්ථික, අධ්‍යාපනික, සමාජයීය හා සංස්කෘතික අශක්තතා දියුණු කිරීම සහ ස්වේඡාවෙන් සංවිධානයවී සමුපකාර අනන්‍යතාවය ආරක්ෂාකර ගනිමින්, සමුපකාර ප්‍රතිපත්ති හා සාරධර්මවලට අනුකූලව ප්‍රජාතාන්ත්‍රවාදී පාලනයකින් යුක්ත සංවිධානයක් හා ව්‍යවසායකයක් ලෙස පවත්වාගෙන යාම අරමුණු වශයෙන් ඇත්තා වූ, ස්වකීය සාමාජිකයින් වශයෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 04(1)(අ) ඡේදයේ සඳහන් සුදුසුකම් ඇත්තා වූ තැනැත්තන්ගෙන් සමන්විත සමිතයක් ; හෝ

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් සමිතිවල ක්‍රියාකාරිත්වය පහසු කිරීමේ අරමුණු ඇතිව පිහිටුවන ලද ස්වකීය සාමාජිකයින් වශයෙන් ලියාපදිංචි සමිතිවලින් පමණක් සමන්විත සමිති සංගමයක් සීමාසහිත වගකීමක් ඇති සමිතියක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.''

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 3(1) උප වගන්තියේ (අ) සහ (ආ) ඡේදවලට ඉක්බිතිව පහත දැක්වෙන අළුත් ඡේදය ඇතුළත් කරනු ලබන අතර එම ඡේදය 3(1) (ඇ) ඡේදය ලෙස බලාත්මක විය යුතු ය.

"(ඇ) ඉහත 03 (1) (අ) සහ (ආ) යටතේ සඳහන් සෑම සමිතියක්ම පූර්ව සමුපකාර සංවිධානයක් ලෙස අඩු තරමින් මාස හයක්වත් කටයුතු කර සමුපකාර සමිතියක් ලෙස කටයුතු කරගෙන යාමේ හැකියාව සනාථ නොකරන්නේ නම්, එවැනි සෑම සමිතියක්ම මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබිය හැකි සමිතියක් ලෙස නොසැළකිය යුතු යි"

ප්‍රධාන ප්‍රඥප්තියේ 04 වැනි වගන්තිය සංශෝධනය කිරීම

05. ප්‍රධාන ප්‍රඥප්තියේ 04(1) (උ) ඡේදයේ විධිවිධානයන්ට ඉක්බිතිව ඇති "තව ද පාසැල් සමුපකාර සමිතියක් .....යන වචනවල සිට .... අදාළ නොවිය යුතු ය" යන වචන දක්වා වූ අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් එකී අතුරු වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"එසේ වුව ද, පාසල් සමුපකාර සමිතියක් සම්බන්ධයෙන් ද ඉහත 04(1)(අ) හා 04(1)(ඉ) ඡේදවල විධිවිධානයන්ට යටත්ව පිහිටුවා ගැනීමට අපේක්ෂිත යම් මූලික සමිතියක අතුරු ව්‍යවස්ථානුකූල අරමුණ අනුව එකී සමිතියේ සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් ලබන තැනැත්තන්, වයස අවුරුදු 36 හෝ ඊට වැඩි වයස් කාණ්ඩයකට අයත් තැනැත්තන්ගෙන් පමණක් සමන්විත විය යුතු වන්නේ නම් එවැනි මූලික සමිතියක් සම්බන්ධයෙන් ද, 04(1)(ඉ) ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වැනි වගන්තිය සංශෝධනය කිරීම

06. ප්‍රධාන ප්‍රඥප්තියේ 06 වැනි වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"ඉහත 05 වැනි වගන්තියේ විධිවිධාන අනුව ලියාපදිංචිය ඉල්ලුම් කරන සමිතියක් විසින් මෙම ප්‍රඥප්තියේ හා ඒ යටතේ සාදනු ලැබ ඇති රීතිවල විධිවිධානයන්ට අනුව ක්‍රියාකර ඇති බවට හා ඒ සමිතිය නියුක්ත වීමට අදහස්

කරන කටයුතු ආර්ථික වශයෙන් සක්‍ය බවට සහ සමිතියේ යෝජිත අතුරු ව්‍යවස්ථාව මෙම ප්‍රඥප්තියට හෝ ඒ යටතේ සාදනු ලැබ ඇති රීතිවලට හෝ පටහැනි නොවන බවට, රෙජිස්ට්‍රාර්වරයා සෑහීමකට පත් වන්නේ නම් සහ තමා සුදුසු යැයි සලකතහොත්, ඔහු විසින් ඒ සමිතිය හා එහි අතුරු ව්‍යවස්ථා ලියාපදිංචි කළ හැකි ය. නැතහොත් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම කළ හැකි ය. මෙම ප්‍රඥප්තියේ 05 වැනි වගන්තියේ විධිවිධාන යටතේ ඉදිරිපත් කළ යුතු ලියවිලි තමා වෙත ලැබී දින 45ක් ඇතුළත ලියාපදිංචි කිරීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ තීරණය යෝජිත සමිතියේ ලේකම් වෙත දැන්වීම් රෙජිස්ට්‍රාර්වරයාගේ යුතුකම වන්නේ ය. තව ද, යම් සමිතියක් ලියාපදිංචි කරන ලෙස ඉදිරිපත් කර ඇති ඉල්ලීම රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රතික්ෂේප කිරීමකට විරුද්ධව අභියාචනයක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීමට එකී යෝජිත සමිතියේ කාරක සභාවට හිමිකම් තිබිය යුතු ය. එවැනි අභියාචනයක් ඉහත කී රෙජස්ට්‍රාර්වරයාගේ තීරණයේ දින සිට දින 45ක් ඇතුළත සිදු කළ යුතු අතර, එවැනි අභියාචනයක් ඉදිරිපත් කළ දිනයේ සිට දින 45ක් ඇතුළත අමාත්‍යවරයාගේ තීන්දුව ලබා දිය යුතු ය.

07. ප්‍රධාන ප්‍රඥප්තියේ 7(1) උප වගන්තිය 7 (2) ලෙසට හා 7(2) උප වගන්තිය 7(1) ලෙසට නැවත අංකනය කිරීමෙන් ඒ උප වගන්තීන් මෙයින් සංශෝධනය කරනු ලැබේ ඃ

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වැනි වගන්තිය සංශෝධනය කිරීම

(1) (06) වැනි උප වගන්තිය යටතේ සමිතියක් ලියාපදිංචි කරනු ලැබූ විට, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සමිතිය වෙත ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් අත්සන් කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහතිකයක්, ඒ සහතිකයේ සඳහන් සමිතියෙහි ලියාපදිංචි කිරීම අවලංගුකර ඇති විටක දී හැර එකී සමිතිය යථා පරිදි ලියාපදිංචි කරනු ලැබූ බවට තීරණාත්මක සාක්ෂිය විය යුතු ය."

08. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ ඃ-

ප්‍රධාන ප්‍රඥප්තියේ 09 වැනි වගන්තිය සංශෝධනය කිරීම

(1) "ප්‍රධාන ප්‍රඥප්තියේ 9(1) උප වගන්තියේ "ලියාපදිංචි කළ සමිතියක් ..... යන වචනවල සිට ....... සම්මත කරගනු ලැබූ යෝජනාවකින් " දක්වා වූ වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් එකී උප වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ ඃ-

"ලියාපදිංචි කළ ඒ එක් එක් සමිතියක් විසින් කලින් ලබාගත් රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය සහ ඒ එක් එක් සමිතියේ මහ සභා රැස්වීමකට පැමිණ ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන් තුනෙන් දෙකට වැඩි සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කරගනු ලබන යෝජනාවකින් "

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 9(1) උප වගන්තියේ (අ) සහ (ආ) වගන්තිවලට මුලින් (අ) යනුවෙන් අළුත් වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර ප්‍රධාන ප්‍රඥප්තියේ පැවති (අ) සහ (ආ) වගන්ති පිළිවෙලින් (ආ) සහ (ඇ) ලෙස බලාත්මක විය යුතු ය.

"(අ) එසේ වුව ද, 9(2) උප වගන්තිය යටතේ කාර්යයක් සඳහා ලියාපදිංචි කළ සමුපකාර සමිතියක ඡන්ද බලය හිමි සාමාජික සංඛ්‍යාවක් වූ තුනෙන් දෙක (2/3)ක සණ පූරණය සඳහා සාමාජිකයන් රැස්කර ගත නොහැකි බව සහ ඒ සමිතියේ ව්‍යාපාර කටයුතු එම සමිතියට කරගෙන යා නොහැකි බවට රෙජිස්ට්‍රාර් සෑහීමකට පත්වන්නේ නම් ඒ සමිතියට අදාළව අතුරු ව්‍යවස්ථානුකූල සාමාන්‍ය මහ සභා රැස්වීමකින් බහුතර කැමැත්ත ඇතිව 9(1) උප වගන්තියේ කාර්යයන් සඳහා අනුමැතිය දීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇති වන්නේ ය"

09. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ ඃ

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වැනි වගන්තිය සංශෝධනය කිරීම

(1) ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වැනි වගන්ති (2) වැනි උප වගන්තියෙහි "වී අලෙවි මණ්ඩලයේ " යන වචන වෙනුවට "රජය හෝ පළාත් සභාවක් හෝ විසින් පිළිගත් ආයතනයක " යන වචන ආදේශ කිරීමෙන් ඒ උප වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වැනි වගන්තියේ 11(අ)(i), 11(අ)(ii) අනුඡේද 11(2)(අ)(i), 11(2)(අ)(ii) අනු ඡේද ලෙස නැවත අංක කිරීමෙන් ද 11(ආ), 11(ඇ), 11(ඈ), 11(ඉ) ඡේද පිළිවෙලින් 11(2)(ආ), 11(2)(ඇ), 11(2)(ඈ), 11(2)(ඉ) ඡේද ලෙස නැවත අංක කිරීමෙන් ද එම අනු ඡේද හා ඡේද මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වැනි වගන්තියේ 11(අ)(i) අනු ඡේදයේ පළමු කොටස ඉවත් කර ඒ වෙනුවට පහත වචන ආදේශ කරමින් ද එම අනුඡේදයේම දෙවනි කොටසේ "වර්ෂයක කාලයක් " යන්න "මාස 06ක් " ලෙස වෙනස් කිරිමෙන් ද එම අනු ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(i) සාමාජික කොටසක අවම වටිනාකම රුපියල් සියයක් (රු. 100) විය යුතු ය. එම වටිනාකම වාරික වශයෙන් මාස 06ක් තුළ ගෙවා නිම කළ යුතු ය. සාමාජික කොටසක සම්පූර්ණ වටිනාකම එකවර වුව ද ගෙවනු ලැබිය හැකිය. එමෙන්ම යම් ලියාපදිංචි සමිතියක අතුරු ව්‍යවස්ථා මගින් සාමාජික කොටසක වටිනාකම රුපියල් සියයට (රු. 100/-) වඩා වැඩි වටිනාකමකින් නියම කිරීමට ඉහත විධිවිධාන බාධාවක් නොවිය යුතු ය."

එසේ වුව ද බඳවා ගැනීමේ දින සිට මාස හයක කාලයක් ඉකුත් වන තෙක් හා එක කොටසකවත් සම්පූර්ණ වටිනාකම ගෙවා නිම කරන තෙක් ඡන්දය දීමේ අයිතිය හා ධූර දැරීමේ අයිතිය ඇතුළත් පූර්ණ සාමාජික අයිතිවාසිකම් කිසිම සාමාජිකයෙකු විසින් භුක්ති නොවිඳිය යුතු ය. එතෙකුදු වුවත්, ප්‍රධාන ප්‍රඥප්තියේ 4(1)(අ) හා 4(1)(ආ) සහ 5(1) හා 5(2) වගන්තිවලින් අනුදත් පරිපාටිය යටතේ සමිතියක් අලුතින් ලියාපදිංචි කිරීමට රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලුම් කරන පුද්ගලයන් සඳහා මෙය බල නොපැවැත්විය යුතු ය.

(4) ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වැනි වගන්තියේ (2)(අ)(ii) අනු ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් ඒ අනු ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ :

"(ii) එසේ වුව ද, පාසල් සමුපකාර සමිතියක් සම්බන්ධයෙන් වූ කල ඉහත (2)(අ) (i) ඡේදයේ හා ඉක්බිතිව ඇති අතුරු වගන්තියේ විධිවිධාන ද, ලියාපදිංචි කළ සමුපකාර සමිති සාමාජිකයින් වන සමිති සම්බන්ධයෙන් වූ කල, ඉහත (2)(අ)(i) ඡේදයට ඉක්බිතිව ඇති අතුරු වගන්තියේ විධිවිධාන ද බල නොපැවැත්විය යුතු ය. තව ද, අක්‍රිය තත්ත්වයකට පත්ව තිබෙන යම් ලියාපදිංචි කළ සමුපකාර සමිතියක් ප්‍රතිසංවිධානය කර යළි ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීම සඳහා මහ සභා රැස්වීමකට සහභාගි වීමට, ඒ සමිතියේ අතුරු ව්‍යවස්ථාවෙන් බලයලත් සාමාජිකයින්ට හෝ නියෝජිතයින්ට ඒ ඒ සමිතිය යළි ප්‍රතිසංවිධානය කිරීමේ ප්‍රථම මහ සභා රැස්වීමේ සිට එක් වසරක කාලයක් ගත වන තුරු පමණක් ඉහත (2) (අ) (i) ඡේදයට ඉක්බිතිව ඇති අතුරු වගන්තියේ විධිවිධාන වෙනුවට ඒ සමිතියේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අදාල වන පරිදි බලපැවැත්විය යුතු ය.".

(5) ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වැනි වගන්තියේ (2)(ආ) ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ :

"(ආ) පාසල් සමුපකාර සමිති හැර වෙනත් සෑම ලියාපදිංචි සමුපකාර සමිතියක්ම සම්බන්ධයෙන් වූ කල්හි පූර්ණ සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසුව පමණක් ඒ සමිතියේ රැස්වීමක දී ඡන්දය දීමට සහ ධූරයකට තෝරා පත්කර ගැනීමට සාමාජිකයෙකුට හිමිකම් ඇත්තේ ය. "

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වැනි වගන්තිය සංශෝධනය කිරීම

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 19(2) උප වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"(2) ලියාපදිංචි කළ සෑම සමිතියකම ස්වකීය සාමාජිකයන් පිළිබඳ පහත විස්තර දැක්වෙන සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය :-

(අ) සාමාජික අංකය, නම, ලිපිනය සහ රැකියාව ;
(ආ) මිලට ගැනීමට එකඟ වී ඇති කොටස් ගණන ;
(ඇ) බඳවා ගන්නා දිනට ඒ ඒ සාමාජිකයාගේ වයස ;
(ඈ) ඒ ඒ සාමාජිකයාගේ නම සාමාජික නාම ලේඛනයට ඇතුළත් කළ දිනය ;
(ඉ) සාමාජිකත්වය අහිමි වූ දිනය හා හේතුව ;
(ඊ) එක් එක් සාමාජිකයා විසින් නම් කළ පසු අයිතිකරුගේ නම හා ඥාති සම්බන්ධය ;
(උ) එක් එක් සාමාජිකයාගේ අත්සන හෝ වම් මාපට ඇඟිලි සලකුණ ;
(ඌ) ජාතික හැඳුනුම්පත් අංකය හා එය නිකුත් කළ දිනය.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වැනි වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වැනි වගන්තිය සංශෝධනය කිරීම

(1) ප්‍රධාන ප්‍රඥප්තියේ 22(6) වැනි උපවගන්තියේ (අ) වැනි ඡේදයෙහි "සෑම සංශෝධනය කිරීමේ ආඥාවක්ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින ක්‍රියාත්මක විය යුතුයි " යන වචන වෙනුවට "එලෙස කරනු ලබන සෑම සංශෝධනයක්ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු ය " යන වචන ආදේශ කිරීමෙන් ඒ ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 22(10) උප වගන්තියෙහි "සමිතියකට සමිතියක් " යන වචන අතරට විරාම ලකුණ යෙදීමෙන් ඒ උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ ‍:

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වැනි වගන්තියේ (11)(අ) වැනි ඡේදයේ "ඉන් යම් කොටසක් කපාගත යුතු ය" යන වචන වලට ඉක්බිතිව "තවද" යන වචනය ඇතුළත් කිරීමෙන් ඒ ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ :

(4) ප්‍රධාන ප්‍රඥප්තියේ 22(11) වැනි උපවගන්තියේ (ආ) ඡේදයේ අවසාන වචනය වන "යුතු ය" යන වචනය වෙනුවට "හැකිය" යන වචනය ආදේශ කිරීමෙන් ඒ ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 23(3) උපවගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වැනි වගන්තිය සංශෝධනය කිරීම

22 වැනි සහ 23(1), (2) වගන්තිවල සඳහන් වන අයුරින් භාණ්ඩ මිලදී ගැනීමේදී හා බෙදා හැරීමේ දී විෂයය භාර ගරු අමාත්‍යවරයාගේ අභිමතය පරිදි යනුවෙන් සඳහන් වන අවස්ථාවල දී එසේ අභිමතය ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ, රටේ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් වූ අවස්ථාවක දී හෝ බස්නාහිර පළාත තුළ එවැනි හදිසි තත්ත්වයක් ඇති විටක දී හෝ සමිතියක් වුව ද නොවුව ද වෙළඳපල ඒකාධිකාරියක් ඇති කිරීමට උත්සාහ ගන්නා අවස්ථාවක දී හෝ වෙළඳපල අක්‍රමිකතාවයක් පවතින්නේ යැයි විෂයය භාර අමාත්‍යවරයා සෑහීමකට පත්වන අවස්ථාවල ද, අත්‍යවශ්‍ය භාණ්ඩ සම්බන්ධව මිලදී ගැනීම් හා බෙදාහැරීම් සම්බන්ධයෙනි.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වැනි වගන්තිය සංශෝධනය කිරීම

(1) ප්‍රධාන ප්‍රඥප්තියේ 24(අ) උපවගන්තිය 24(1) උපවගන්තිය ලෙස ද, 24(1), (2), (3) ඡේද පිළිවෙලින් 24(1)(අ), (ආ), (ඇ). ඡේද ලෙස නැවත අංක කිරීමෙන් ද එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ ;

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 24(1)(ආ) ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"සමිතිය විසින් සාමාජිකයකුට හෝ කලින් සිටි සාමාජිකයකුට දෙන ලද මුදලින් හෝ භාණ්ඩවලින් වූ යම් ණයකින් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් ඔහුට සපයන ලද හෝ ඔහු විසින් මිලට ගනු ලැබූ යම් ගවයන්, ගවයන් සඳහා වූ ආහාර, කෘෂිකාර්මික හෝ කාර්මික උපකරණ හෝ නිෂ්පාදනයට ගන්නා අමු ද්‍රව්‍ය හෝ කර්මාන්ත ශාලා, ගබඩා, ව්‍යාපාරික ස්ථාන හෝ කෙරෙහි පළමු බැඳීමක් විය යුතු ය. එසේ වුව ද, මෙහි අන්තර්ගත කිසිවක්, එවැනි යම් වගාවක් හෝ වෙනත් කෘෂිකාර්මික ද්‍රව්‍යයක්, ගවයන්, ගවයන් සඳහා වූ ආහාර හෝ කෘෂිකාර්මික හෝ කාර්මික උපකරණ හෝ නිෂ්පාදනයට ගන්නා අමු ද්‍රව්‍ය, දැනුම්දීමක් නොමැතිව සද්භාවයෙන් මිලයට ගන්නා ගැණුම්කරුවකුගේ හෝ පැවරුම්ලාභියකුගේ හිමිකම් කෙරෙහි බල නොපෑ යුතු ය. තව ද,"

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ 24(1) (ඇ) ඡේදයෙහි "වී අලෙවි මණ්ඩලයේ " යන වචන වෙනුවට "රජය හෝ පළාත් සභාවක් හෝ විසින් පිළිගත් ආයතනයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

14. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වැනි වගන්තියේ (අ)(ආ)(ඇ) ප්‍රධාන උපවගන්තීන් පිළිවෙලින් (1)(2)(3) උපවගන්තීන් ලෙස අංක කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වැනි වගන්තිය සංශෝධනය කිරීම

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 25(3) උපවගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන නව වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එම උපවගන්තිය (4) උපවගන්තිය ලෙස බලාත්මක විය යුතු යි :-

"ඒ සමිතියට හෝ අන් ලියාපදිංචි කළ සමිතියකට හෝ අදාල සාමාජිකයා හා සමිතිය අතර ඇති වූ ගණුදෙනුවක් මත අයවිය යුතු මුදලක්."

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වැනි වගන්තිය සංශෝධනය කිරීම

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 27(2) වැනි උපවගන්තියේ "ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයකු විසින් ඒ ලියාපදිංචි සමිතියට" යන වචන වෙනුවට "ලියාපදිංචි කළ සමිතියක් විසින්, මියගිය සාමාජිකයකුට" යන වචන ආදේශ කිරීමෙන් ඒ උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වැනි වගන්තිය සංශෝධනය කිරීම

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වැනි වගන්තියේ අවසාන වචන වූ "සාක්ෂි තිබිය යුතු ය" යන වචන වෙනුවට "සාක්ෂි විය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වැනි වගන්තිය සංශෝධනය කිරීම

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 31(2) වැනි උපවගන්තියේ "විධිවිධාන'' යන වචනය වෙනුවට "විධාන" යන වචනය ආදේශ කිරීමෙන් ඒ උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වැනි වගන්තිය සංශෝධනය කිරීම

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :

(1) ප්‍රධාන ප්‍රඥප්තියේ 33(i) උපවගන්තිය 33(1) ලෙස නැවත අංක කිරීමෙන් එම උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 33(ii)(අ) ඡේදය, 33(2)(අ) ඡේදය ලෙස නැවත අංක කිරීමෙන් ද, එම ඡේදයේ විධිවිධානවලට ඉක්බිතිව පහත දැක්වෙන නව විධිවිධානය ඇතුළත් කිරීමෙන් ද ඒ ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ :

"(අ) එසේ වුව ද යම් ලියාපදිංචි සමිතියක අදාළ වසරට කලින් වසරේ වාර්ෂික පිරිවැටුමෙන් සියයට එකක් හෝ රුපියල් ලක්ෂ පහක් යන දෙකෙන් අඩු මුදල දක්වා වූ මුදලක වටිනාකමක් ඇති චංචල දේපළ මසකට එක ගණුදෙනුවකට යටත්ව මහ සභාවේ සහ රෙජිස්ට්‍රාර්වරයාගේ ලිඛිත අනුමැතිය ලබා නොගෙන අත්කර ගැනීම හෝ මිලදී ගැනීම හෝ විකිණීම හෝ බැහැර කිරීම කළ හැකිය". එසේ නමුත්, එකී එක් එක් ගණුදෙනුව පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් එකී ගණුදෙනුවට පසුව එළැඹෙන මහ සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතු ය.

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ 33(ii)(ආ) ඡේදය, 33(2)(ආ) ඡේදය ලෙස නැවත අංක කිරීමෙන් ද එම ඡේදයේ විධිවිධානවලට ඉක්බිතිව පහත දැක්වෙන නව විධිවිධානය ඇතුළත් කිරීමෙන් ද එම ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ :

(ආ) "එසේ වුව ද යම් ලියාපදිංචි සමිතියක අදාළ වසරට කලින් වසරේ වාර්ෂික පිරිවැටුමෙන් සියයට එකක් හෝ රුපියල් ලක්ෂ දහයක් යන දෙකෙන් අඩු මුදල දක්වා වූ වටිනාකමක් ඇති නිශ්චල දේපළ වසරකට ගනුදෙනු තුනකට යටත්ව මහ සභාවේ හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ ලිඛිත අනුමැතිය ලබා නොගෙන අත්කර ගැනීම හෝ බැහැර කිරීම හෝ ගොඩනැගිලි ඉදිකිරීම හෝ කළ හැකි ය.

එසේ නමුත්, එකී එක් එක් ගනුදෙනුව සිදු කර මසක් ඇතුළත කොමසාරිස්වරයාට වාර්තා කළ යුතු අතර එක් එක් ගනුදෙනුව පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් ගණුදෙනුවට පසුව එළැඹෙන මහ සභාවට ඉදිරිපත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වැනි වගන්තිය සංශෝධනය කිරීම

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 (2) වැනි උපවගන්තියෙහි "ආණ්ඩුව" යන වචන වෙනුවට "මධ්‍යම රජය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වැනි වගන්තිය සංශෝධනය කිරීම

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 35(1) උපවගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''මෙම ප්‍රඥප්තියේ විධිවිධානයන්ට අනුව රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබ ඇති හා ලැබ ඇතැයි සැලකෙන සෑම අතුරු ව්‍යවස්ථා විධිවිධානයක්ම පිළිපැදීමට ඒ සමිතියේ සෑම සාමාජිකයකුම බැඳී සිටිය යුතු ය.

මෙම වගන්තියේ සාමාජිකයා යන්නට, එකී සමිතිය ලියාපදිංචි කිරීමට පෙර හෝ පසුව එකී සමිතියේ සාමාජිකත්වය දැරූ සියලු දෙනා අයත් වේ."

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 38(1) උප වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ උප වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වැනි වගන්තිය සංශෝධනය කිරීම

"ලියාපදිංචි කළ සමිතියක් විසින් ඒ සමිතියේ සාමාජිකයකු නොවන කිසිම තැනැත්තෙකුට මුදල්මය හෝ ද්‍රව්‍යමය හෝ වශයෙන් කිසිදු ණයක් ප්‍රදානය නොකළ යුතු ය. එසේ වුව ද, ස්වකීය මහා සභාවේ පූර්ව අනුමැතිය ඇතිව හා මහා සභාව විසින් නියම කරන කොන්දේසි වලට අනුකූලව සැකසූ විධිමත් ගිවිසුමකට යටත්ව, ලියාපදිංචි කළ සමිතියක් විසින් වෙනත් ලියාපදිංචි කළ සමිතියකට ණය ප්‍රදානය කළ හැකි ය. නැතහොත් ආශ්‍රිත සාමාජිකයකුට හෝ රජයේ දෙපාර්තමේන්තුවකට හෝ රාජ්‍ය අනුබද්ධිත ආයතනයකට ණයට ද්‍රව්‍ය සැපයිය හැකි ය."

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වැනි වගන්තිය සංශෝධනය කිරීම

(1) ප්‍රධාන ප්‍රඥප්තියේ 39(1) උප වගන්තිය ඉවත් කර පහත දැක්වෙන නව උප වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම උප වගන්තිය 39(1) උප වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය ඃ

ලියාපදිංචි කළ සමිතියක් විසින් රීති වලින් හෝ අතුරු ව්‍යවස්ථා වලින් එසේ නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයකට හා එසේ නියම කරනු ලැබිය හැකි කොන්දේසි යටතේ පමණක් සාමාජිකයන් නොවන තැනැත්තන්ගෙන් තැන්පතු හා ණය මුදල් භාර ගත යුතු ය.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 39(2) උප වගන්තිය 39(4) උප වගන්තිය ලෙසට නැවත අංක කරනු ලබන අතර 39(2) උප වගන්තිය ලෙසට පහත දැක්වෙන නව උප වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම උප වගන්තිය 39(2) උප වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

රජය හෝ පළාත් සභාව විසින් ණය හෝ ආධාර වශයෙන් සපයනු ලබන මුදල් යම් ලියාපදිංචි සමුපකාර සමිතියකට ලබාගත හැකිය. එසේ වුව ද එසේ සපයන ණය හෝ ආධාර මුදල් ඒ සඳහා පනවනු ලබන කොන්දේසි වලට අනුකූලව භාවිතා කිරීම එකී සමිතියේ කළමනාකරණ මණ්ඩලයේ වගකීම වන්නේ ය.

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ 39(2) උප වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන නව වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම උප වගන්තිය 39(3) උප වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

විදේශ හෝ රාජ්‍ය නොවන සංවිධානවල ආධාර, ණය හෝ ප්‍රදාන, අදාළ විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව ලියාපදිංචි කළ සමුපකාර සමිතියකට ලබාගත හැකිය.

(4) ප්‍රධාන ප්‍රඥප්තියේ 39(4) උප වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන නව වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම උප වගන්තිය 39(5) උප වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

යම් සමුපකාර සමිතියක් පෞද්ගලික, විදේශ හෝ රාජ්‍ය නොවන සංවිධානයක් සමඟ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරන්නේ නම් එකී ව්‍යාපාරයට අදාලව සම්පූර්ණ වාර්තාවක් මහ සභාවට ඉදිරිපත් කර අනුමතිය ගැනීමෙන් පසු අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ව්‍යාපාර කටයුතු සඳහා ගිවිසුම් වලට එළඹිය හැකිය."

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 41(1) උප වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන නව විධිවිධානය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ ඃ

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වැනි වගන්තිය සංශෝධනය කිරීම

සෑම මූලික සමිතියක්ම හා එවැනි සමිතියක තැන්පත් ලබාගෙන ඇති සෑම මූලික නොවන සමිතියක්ම, සිය අරමුදල් 41(1) වගන්තියේ විධිවිධාන අනුව රාජ්‍ය බැංකුවක තැන්පත් කළ යුතු ය. එසේ වුවද රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබාගෙන ශ්‍රී ලංකා මහ බැංකුව පිළිගත් බැංකුවක හෝ සමුපකාර සංගමයක හෝ සමිතියක හෝ සමුපකාරයට අනුබද්ධ මුල්‍ය ආයතනයක තැන්පත් කළ හැකි ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වැනි වගන්තිය සංශෝධනය කිරීම

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :

(1) ප්‍රධාන ප්‍රඥප්තියේ 44 (1) වැනි උප වගන්තියෙහි "සමුපකාර දෙපාර්තමේන්තුවේ පාලක මණ්ඩලයක් කටයුතු කරන .... යන වචන වල සිට ...... විගණනය කරවිය යුතු ය" දක්වා වූ වගන්තිය ඉවත් කිරීමෙන් ද එහි පළමු වාක්‍යයෙහි සඳහන් ගණන් යන වචනය වෙනුවට ගිණුම් යන වචනය ආදේශ කිරීමෙන් ද එකී වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 44(2) වැනි උප වගන්තියේ (ඈ) ඡේදයේ "ඒ ප්‍රඥප්තියේ රීතිවල" යන වචන වෙනුවට "මෙම ප්‍රඥප්තියේ හෝ රීතිවල හෝ " යන වචන ආදේශ කිරීමෙන් ඒ ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වැනි වගන්තිය සංශෝධනය කිරීම

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :

(1) ප්‍රධාන ප්‍රඥප්තියේ 46(1) උප වගන්තියෙහි "සමුපකාර රෙජිස්ට්‍රාර්වරයා සමඟ ලියාපදිංචි වී ඇති " දක්වා වූ වචන ඉවත්කර ඒ වෙනුවට "ලියාපදිංචි" යන වචනය ආදේශ කිරීමෙන් එකී උප වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 46(3) වැනි උප වගන්තියෙහි "ඡන්දය සමානව බෙදී ගිය.....යන වචන වල සිට .....සභාවට ඉදිරිපත් කළ යුතුය" යන වචන දක්වා වූ විධිවිධාන වෙනුවට පහත දැක්වෙන විධිවිධාන ආදේශ කරමින් එකී උප වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :

"ඡන්දය සමානව බෙදී ගියහොත් එකී ඡන්දය විමසූ කරුණ හෝ යෝජනාව නිශ්ප්‍රභා වූවා සේ සැලකිය යුතු ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වැනි වගන්තිය සංශෝධනය කිරීම

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 47(8) වැනි උප වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය (9) වන උප වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :

ඉහත 8(ඈ) උප වගන්තියේ විධිවිධාන අනුව කැඳවන මහා සභා රැස්වීමකට අදාලව ද, මෙම ප්‍රඥප්තියේ 46(3) උප වගන්තියේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වැනි වගන්තිය සංශෝධනය කිරීම

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වැනි වගන්තිය ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එම වගන්තිය (48) වැනි වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :

(1) (අ) 46 වැනි වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ 47 වගන්තිය යටතේ වූ පරීක්ෂණයකින් හෝ විමර්ශනයකින් හෝ පසුව ලියාපදිංචි කළ යම් සමුපකාර සමිතියක කාරක සභාවක් හෝ එකී කාරක සභාවේ යම් සාමාජිකයින් තම යුතුකම් නිසි ආකාරයෙන් ඉටුකර නොමැති බව හා ඉටු නොකරන බව රෙජිස්ට්‍රාර්වරයාගේ නිගමනය වන්නේ නම්, එකී කාරක සභාව විසුරුවා හැරීම හෝ එහි යම් සාමාජිකයෙකු හෝ එහි යම් සාමාජිකයන් සිය ධූරවලින් ඉවත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් එකී කාරක සභාවට හෝ එහි යම් සාමාජිකයකුට හෝ සාමාජිකයින්ට චෝදනා පත්‍රයක් නිකුත් කළ යුතු ය. එකී චෝදනා පත්‍රයට ලැබෙන පිළිතුරු පිළිබඳව සෑහීමකට පත් නොවන්නේ නම් එකී චෝදනාලාභියාගේ ධූරය කොමසාරිස්වරයා විසින් අත්හිටුවිය යුතු ය. එකී චෝදනා වලට ලැබෙන පිළිතුරු සමාලෝචනය කිරීම පිණිස මෙම වගන්තියේ (5) උපවගන්තිය යටතේ පිහිටුවනු ලබන සමාලෝචන මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. සමාලෝචන මණ්ඩලය නිර්දේශ කරනු ලබන්නේ නම්, එම නිර්දේශ සලකා බැලීමෙන් පසු රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියවිල්ලකින් වූ නියෝගයක් මගින්,

(i) එකී කාරක සභාව විසුරුවා හැරීම හෝ එකී කාරක සභාවේ යම් සාමාජිකයකු හෝ සාමාජිකයින් ධූරවලින් ඉවත් කිරීම කරනු ලැබිය හැකිය.

(ii) (අ)(i) අනු ඡේදය යටතේ රෙජිස්ට්‍රාර් විසින් ක්‍රියාකර ඇති විටදී මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි පත්කරනු ලබන සුදුසු තැනැත්තෙකු හෝ තැනැත්තන් විසින් සමිතියේ කටයුතු කළමණාකරණය හා පරිපාලනය කළ යුතු යැයි රෙජිස්ට්‍රාර් විසින් විධාන කරනු

ලැබිය හැකිය. එසේ පත්කරනු ලබන තැනැත්තෙකු හෝ තැනැත්තන් අනිවාර්යයෙන්ම රාජ්‍ය නිලධාරීන් විය යුතු ය. එසේ පත් කරනු ලබන තැනැත්තන්ගේ නිල කාලය අවුරුදු එකකට සීමා විය යුතු ය.

(iii) 46 වගන්තිය යටතේ වූ විභාගයක් හෝ 47 වගන්තිය යටතේ වූ පරීක්ෂණයක් හෝ විමර්ශනයක් ආරම්භ කර මාස 18ක් ඇතුළත 48(1)(අ) උප වගන්තිය සහ 48(1)(අ)(i) අනු ඡේදය අනුව කටයුතු කළ යුතු ය.

(ආ) ඉහත 48(අ)(i) අනුඡේදය යටතේ විසුරුවා හරිනු ලබන කාරක සභාවේ සාමාජිකයින්ට හා ධුරවලින් ඉවත් කරනු ලැබූ කාරක සභිකයින්ට එසේ විසුරුවා හරිනු ලැබූ හෝ ඉවත් කරනු ලැබූ දින සිට වසර හතක (7) ක කාලයක් ඉකුත් වන තෙක් නැවත වරක් එකී සමිතියේ හෝ වෙනත් ලියාපදිංචි සමුපකාර සමිතියක ධුරයකට තේරී පත්වීමකට හිමිකමක් නොතිබිය යුතු ය. නැතහොත් එසේ තේරී පත්වීම නිත්‍යානුකූල නොවිය යුතු ය.

(ඇ) මෙම ප්‍රඥප්තියේ 46 වැනි වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ 47 වැනි වගන්තිය යටතේ වූ පරීක්ෂණයකින් හෝ විමර්ශනයකින් හෝ පසුව, යම් ලියාපදිංචි කළ සමුපකාර සමිතියක කාරක සභාවක හිටපු යම් සාමාජිකයෙකු හෝ යම් සාමාජිකයන්, සිය යුතුකම් නිසි ආකාරයෙන් ඉටු කර නොමැති බව රෙජිස්ට්‍රාර්වරයාගේ නිගමනය වන්නේ නම් එකී චෝදනා හා ඒවාට ලැබෙන පිළිතුරු එකී සමිතියේ නිත්‍යානුකූලව ස්ථාපිත වී ඇති මහ සභාවක් තිබේ නම් එම මහ සභාවට ඉදිරිපත් කළ යුතු ය. එකී චෝදනා පත්‍ර හා පිළිතුරු සමාලෝචනය කිරීම පිණිස මෙම වගන්තියේ (5) උපවගන්තිය යටතේ පිහිටුවනු ලබන සමාලෝචන මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය. සමාලෝචන මණ්ඩලය නිර්දේශ කරනු ලබන්නේ නම්, එම නිර්දේශ සලකා බැලීමෙන් පසු රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියවිල්ලකින් වූ නියෝගයක් මගින් එකී නියෝගයේ දින සිට වසර හතක කාලයක් ඉකුත් වන තෙක් නැවත වරක් තේරී පත්වීම නුසුදුසු බවට විධාන කරනු ලැබිය යුතු ය. එවැනි විධානයකට යටත්වන යම්කිසි තැනැත්තෙකු එකී විධානයේ දින සිට වසර හතක කාලයක් ඉකුත් වන තෙක් යම්කිසි ලියාපදිංචි සමුපකාර සමිතියක කාරක සභාවට තේරීපත්වීම නීත්‍යානුකූල නොවිය යුතු ය. එසේ වුව ද මෙම ප්‍රඥප්තිය සම්මත වූ දිනට පූර්ව වසර හතක් ඇතුළත දඬුවමකට ලක් වූ යම්කිසි තැනැත්තෙකුට එකී දඬුවම පිළිබඳව යළි සලකා බැලීම සඳහා සමාලෝචන මණ්ඩලයට ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකිය.

(ඈ) (අ) වැනි ඡේදයේ (ii) අනු ඡේදය යටතේ නිකුත් කරනු ලබන විධානයන් යටතේ පත් කරනු ලබන තැනැත්තකුගේ හෝ තැනැත්තන්ගේ නිල කාලය 48(1)(අ)(i) අනු ඡේදය යටතේ ඉවත් කරනු ලැබූ තැනැත්තන්ගේ ඉතිරි නිල කාලයට සීමා විය යුතුය. එසේ වුව ද, යම්කිසි ලියාපදිංචි කළ සමුපකාර සමිතියක අතුරු ව්‍යවස්ථානුකූලව මහා සභාවක් ස්ථාපිත වී නොමැති නම් එවැනි මහා සභාවක් ස්ථාපිත කර කාරක සභාවක් තෝරා පත් කර ගන්නා තුරු එම පත් කරන ලද තැනැත්තෙකුගේ හෝ තැනැත්තන්ගේ නිල කාලය දීර්ඝ කිරීමට කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්ට බලය තිබිය යුතු ය. තව ද, එවැනි මහා සභාවක් ස්ථාපිත කිරීම සඳහා බාධා වන යම් අතුරු ව්‍යවස්ථා විධිවිධාන වෙතොත් අදාළ විධිවිධානවලින් නිදහස් කර මහා සභාව සංස්ථාපනය කිරීමට අවශ්‍ය නියමයන් කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය තිබිය යුතු ය.

(ඉ) රෙජිස්ට්‍රාර් විසින් (අ) වැනි ඡේදය යටතේ යම් නියෝගයක් කරනු ලැබූ අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයාට ඒ නියෝගයෙන්ම හෝ පසුව වූ නියෝගයකින් ඒ සමිතියේ කටයුතු පාලනය හා පරිපාලනය කිරීමට සුදුසු හා නිසි නැතැත්තෙකු හෝ තැනැත්තන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් පත්කළ යුතු අතර, එසේ පත්කරනු ලැබූ යම් තැනැත්තෙකු කලින් කල ඉවත් කිරීම හෝ ඔහු වෙනුවට වෙන තැනැත්තකු පත් කිරීම හෝ අතිරේක තැනැත්තන් පත් කිරීම කළ හැකි ය.

(ඊ) රෙජිස්ට්‍රාර්ගේ සාමාන්‍ය විධානවලට හා පාලනයට යටත්ව, ලියාපදිංචි කළ සමිතියක කටයුතු පාලනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ පත්කරනු ලැබූ යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට :-

(i) සමිතියේ වත්කම් අයකර ගැනීමේ හා බැඳීම් ඉටුකිරීමේ දී එහි යහපත සඳහා අවශ්‍ය වියහැකි වෙනයම් පියවරවල් ගැනීමේ දී ද බලය තිබිය යුතු ය ; තවද

(ii) සමිතියේ යථා පරිදි සංස්ථාපනයක් කරන ලද කාරක සභාවේ සියලු බලතල, අයිතිවාසිකම් හා වරප්‍රසාද තිබිය යුතු අතර, තවද ඒවා ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය. ඒ සමිතියේ කටයුතු කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම උදෙසා අවශ්‍ය වන අවස්ථාවක මහා සභාව සතු බලතල අතුරින් එසේ අවශ්‍ය වන බලතල ද, එම මහා සභාව බැහැර කෙරෙන පරිදි තිබිය යුතු අතර ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

(උ) ලියාපදිංචි කළ සමිතියක කටයුතු පාලනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ පත්කරනු ලැබූ තැනැත්තන් විසින් නීතියට හෝ සමිතියේ අතුරු ව්‍යවස්ථාවලට පටහැනිව කරන ලද යම් ක්‍රියා නිසා සමිතියට විඳීමට සිදු වූ යම් පාඩුවක් සඳහා ඔවුන් සාමූහිකව හා වෙන් වෙන්ව වගකිව යුතු ය.

(ඌ) ලියාපදිංචි කළ සමිතියක කටයුතු පාලනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් විසින් පත්කරන ලද යම් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය ඔහු විසින් නියම කළ හැකිය. එකී පාරිශ්‍රමිකය හා ඒ සමිතියේ කළමණාකාරිත්වයෙහිලා දරන්නට සිදුවන වෙනත් වියදම් ඇතොත් ඒ වියදම් ද එම සමිතියේ මුදල් වලින් ගෙවිය යුතු ය.

(එ) ලියාපදිංචි කළ සමිතියක කටයුතු පාලනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ පත්කරනු ලැබ (අ) වැනි ඡේදයේ (ii) අනුඡේදය යටතේ වූ විධානය බලපැවැත්වීම නතරවන දිනයට පෙරාතුව වූ දිනයෙහි ධුරය දරමින් සිටින තැනැත්තා හෝ තැනැත්තන් විසින් එකී දිනයට පෙර සමිතියේ අතුරු ව්‍යවස්ථාව අනුව අලුත් කාරක සභාවක් පත්කිරීමට කටයුතු පිළියෙල කිරීම ඔහුගේ හෝ ඔවුන්ගේ යුතුකම විය යුතු ය.

(ඒ) 46 වැනි වගන්තිය යටතේ වූ විභාගයක් හෝ 47 වැනි වගන්තිය යටතේ වූ පරීක්ෂණයක් නැතහොත් විමර්ශනයක් නිම කිරීමට පෙර කාරක සභාවට විරුද්ධව මූලික පරීක්ෂණයකින් චෝදනාවක් තහවුරු වී ඇතැයි රෙජිස්ට්‍රාර් වරයාගේ මතය වේ නම් ඒ කාරක සභාව මාස හයක කාල සීමාවක් සඳහා අත්හිටුවීමට ද, සමිතියේ වැඩ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම පිණිස අන්තර් කාලීන මණ්ඩලයක් පත් කිරීමට ද ඔහුට බලය තිබිය යුතු ය. ඒ කාරක සභාව අත්හිටුවනු ලැබූ දින සිට මාස හයක කාල සීමාවක් ඇතුළත ඒ විභාගය හෝ පරීක්ෂණය හෝ විමර්ෂණය රෙජිස්ට්‍රාර්වරයා විසින් නිමකළ යුතු අතර, ඒ කාරක සභාව (අ) ඡේදය යටතේ විසුරුවා හැරීම සම්බන්ධයෙන් අවසාන තීරණයක් ගනු ලැබිය යුතු ය.

(2) (අ) 46 වැනි වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ 47 වැනි වගන්තිය යටතේ වූ පරීක්ෂණයකින් නැතහොත් විමර්ශනයකින් හෝ පසුව යම් ලියාපදිංචි කළ සමිතියක යම් නිලධරයෙකු හෝ සේවා නියුක්තිකයෙකු තම කාර්යය නිසි ආකාරයෙන් ඉටු නොකරන බව හෝ කාර්යක්ෂම ලෙස තම කාර්යය ඉටු කිරීම නුසුදුසු බව නැතහොත් අන්‍යාකාරයකින් නොහැකි බව රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වුවහොත් මේ ප්‍රඥප්තියෙහි හෝ පළාත් සභාවේ 1994 අංක 01 දරන සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, සිය විරෝධතා දැක්වීමට එම නිලධරයාට හෝ සේවා නියුක්තිකයාට අවස්ථාවක් ලබාදීමට යටත්ව අවශ්‍ය විභාගය අවසන් වන තුරු ඔහු විසින් ලියවිල්ලකින් වූ නියෝගයක් මගින් අවස්ථාචෝචිත පරිදි ඒ නිලධරයාගේ හෝ සේවා නියුක්තිකයාගේ සේවය අත්හිටුවීමට හෝ වැඩ තහනම් කිරීම කළ හැකි අතර, ඒ විභාගයෙන් පසුව එම නිලධරයා හෝ සේවා නියුක්තිකයා ධුරයෙන් ඉවත් කළ හැකිය.

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ කරන ලද ඉවත් කිරීමේ නියෝගයකින් අතෘප්තියට පත් යම් සේවා නියුක්තිකයෙකු විසින් දින 30ක කාලයක් ඇතුළත පළාත් සභාවේ 1994 අංක 01 දරන ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමූපකාර සේවක කොමිෂන් සභාව වෙත ඊට විරුද්ධ අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. තව ද, ඒ කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

(ආ) (අ) වගන්තිය යටතේ යම් නිලධාරියෙකු හෝ සේවා නියුක්තිකයෙකු ඉවත් කරනු ලැබ ඇත්තා වූ ද ඒ ඉවත් කිරීමේ නියෝගය සමූපකාර සේවක කොමිෂන් සභාව විසින් ස්ථිර කර ඇත්තා වූ නැතහොත් දින 30ක කාලයක් ඇතුළත ඒ නියෝගයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තා වූ ද, අවස්ථාවක වෙනත් නිලධරයෙකු හෝ සේවා නියුක්තිකයෙකු අවස්ථාචෝචිත පරිදි තෝරා පත්කර ගැනීම හෝ පත් කිරීම සම්බන්ධයෙන් අදාල වන විධිවිධාන අනුව කරනු ලැබිය හැකිය.

(3) රජයේ අරමුදල් වලින් හෝ පළාත් සභා අරමුදල් වලින් හෝ ක්‍රියාත්මක වන ලියාපදිංචි සමිතියක කටයුතු කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සහතික කර ගැනීමේ කාර්යය සඳහා හෝ ඒ සමිතියට රජයෙන් හෝ පළාත් සභාවෙන් හෝ කරන ලද ආයෝජන හෝ මුදලින් නැතහොත් භාණ්ඩ වලින් දෙන ලද ණය හෝ අත්තිකාරම් හෝ ප්‍රදාන හෝ ආරක්ෂා කිරීමේ කාර්යය සහතික කර ගැනීම සඳහා සමිතිය පිළිබඳ කළමනාකරණ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව ලියාපදිංචි සමිතියේ කාරක සභාවට සාමාජිකයන් වශයෙන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් නම් කිරීම අවශ්‍ය බව හෝ අවස්ථාචෝචිත බව රෙජිස්ට්‍රාර්වරයාගේ නිගමනය වන අවස්ථාවක අවශ්‍ය හෝ අවස්ථාචෝචිත පරිදි ඒ ලියාපදිංචි සමිතියේ කාරක සභාවේ සාමාජිකයන් වශයෙන් යම් තැනැත්තන් සංඛ්‍යාවක් පත් කළ හැකි ය. එසේ පත් කරන තැනැත්තන්ගෙන් දෙදෙනෙකුවත් රජයේ නිලධාරීන් විය යුතු ය. අවස්ථාචෝචිත පරිදි එකී තැනැත්තන් දෙදෙනාගෙන් එක් අයෙකු කළමනාකරණය පිළිබඳ නිපුණත්වයක් ඇති විශ්‍රාමික රජයේ සේවකයෙකු වුව ද විය හැකි ය. එම තැනැත්තන් අතුරින් සමිතියේ සභාපති හා උපසභාපති පත් කළ හැක. එසේ සභාපති සහ උප සභාපති පත් කිරීමත් සමඟ එතෙක් එම තනතුරු දැරූ සභාපතිගේ සහ උපසභාපතිගේ එකී තනතුරු අහෝසි වේ. එසේ වුව ද, එසේ පත් කරන සාමාජික සංඛ්‍යාව ඒ කාරක සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් හරි අඩකට වඩා අඩු විය යුතු ය.

(4) (අ) ලියාපදිංචි සමූපකාර සමිතියක කළමනාකරණ කටයුතු අඛණ්ඩව හා විධිමත්ව පවත්වාගෙන යෑම සඳහා පවතින කාරක සභාව වෙනුවට පාලක මණ්ඩලයක් පත් කරන ලෙස, ඒ සමිතියේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව නිසි පරිදි පවත්වනු ලැබූ මහා සභා රැස්වීමකදී බහුතරයකගේ කැමැත්තෙන් සහා සම්මත වූ යෝජනාවකින් රෙජිස්ට්‍රාර්වරයාගෙන් ඉල්ලා සිටිය හොත් එකී සමිතියේ කළමනාකරණ කටයුතු මෙහෙයවීම සඳහා තිදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් යුතු පාලක මණ්ඩලයක් පත් කිරිමට ද, එකී තැනැත්තන් අතුරින් එකී සමිතියේ සභාපති හා උපසභාපති නම් කිරීමට ද රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇත. එසේ පත් කරන නිලධාරීන්ගෙන් දෙදෙනෙකුවත් රජයේ නිලධාරීන් විය යුතු ය. එසේ පත් කරන නිලධාරීන්ගේ නිල කාලය අවුරුද්දකට සීමා විය යුතු ය.

(ආ) යම්කිසි ලියාපදිංචි සමිතියක කාරක සභාවේ සියලුම සාමාජිකයන් හෝ බහුතරයක් හෝ ඉල්ලා අස්වීම නිසා හෝ එකී සමිතියේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කාරක සභිකත්වයට නුසුදුසුකම් මත මෙම ප්‍රඥප්තියේ 48(1)(ආ) වගන්තියේ විධිවිධාන අනුව මුළු කාරක සභාවම හෝ කාරක සභාවෙ බහුතරයක් ඉවත් කිරීමක දී හැර යම්කිසි ලියාපදිංචි සමිතියේ කාරක සභාවේ සියළුම සාමාජිකයන් හෝ බහුතරයක් හෝ ඉල්ලා අස්වීම නිසා හෝ එවකට සියලුම කාරක සභිකයන්ගේ හෝ බහුතරයකගේ කාරක සභික ධූර අහිමිවීම මත ඒ සමිතියේ කාරක සභා පැවැත්වීමට නොහැකි වුවහොත්, ඒ සමිතියේ විශේෂ මහා සභා රැස්වීමක් ඒ නියෝගයේ දින සිට දින 30ක් ඇතුළත පවත්වා කාරක සභාවේ පුරප්පාඩු (අවස්ථාචෝචිත පරිදි මුළු කාරක සභාවේම පුරප්පාඩු) සඳහා සුදුස්සන් තෝරා පත් කර ගැනීමට පියවර ගන්නා ලෙස ඒ සමිතියේ ලේකම්ට නියෝග කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇත. මෙම ප්‍රඥප්තියේ හෝ වෙනත් නීතියක කුමක් සඳහන් වුවත් එවැනි නියෝගයක් නීත්‍යාණුකූල හා බල සහිත වන්නේ ය. එවැනි නියෝගයක දින සිට දින 30ක් ඇතුළත ඒ සමිතියේ මහා සභා රැස්වීමක් පැවැත්වීම අපහසුවීම හෝ මහා සභාව විසින් කාරක සභාවේ පුරප්පාඩු (අවස්ථාචෝචිත පරිදි මුළු කාරක සභාවේම පුරප්පාඩු) සඳහා සුදුස්සන් තෝරා පත් කිරීම ප්‍රතික්ෂේප කිරීම කළහොත් එම සමිතියේ කළමනාකරණ කටයුතු අඛණ්ඩව හා විධිමත්ව පවත්වාගෙන යාම සඳහා තිදෙනෙකුට නොවැඩි පාලක මණ්ඩලයක් පත් කිරීමට ද ඔවුන් අතුරින් සභාපති හා උපසභාපති නම් කර පත් කිරීමට ද රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇත. මෙම ප්‍රඥප්තියේ හෝ වෙනත් නීතියක කුමක් සඳහන් වුවත් එවැනි පත් කිරීමක් හා නම්කර පත්කිරීමක් නීත්‍යානුකූල හා බල සහිත වන්නේ ය. තවද, එවැනි පත් කිරීමක් කරන අවස්ථාවක ඒ සමිතියේ කාරක සභාවේ ධූර දරමින් සිටි යම් කාරක සභික සංඛ්‍යාවක් සිටී නම් ඔවුන්ගේ ධූර එකී පත්කිරීමත් සමග අහෝසි වන්නේ ය. එම පත් කිරීමේ හා නම් කිරීමේ කාලය වසර එකක (01) ට සීමා විය යුතු ය.

(ඇ) ඉහත (අ) හා (ආ) වගන්ති යටතේ පත් කරනු ලබන පාලක මණ්ඩල සාමාජිකයන් අනිවාර්යයෙන්ම රාජ්‍ය සේවකයන් විය යුතු ය.

(ඈ) ඉහත (අ) හා (ආ) වගන්ති යටතේ පත් කරනු ලබන පාලක මණ්ඩලයට, ඒ සමිතියේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවෙන් මහා සභාවට පැවරී ඇති සියලුම බලතල, ක්‍රියාත්මක කිරීමේ බලය හිමි වන්නේ ය.

(ඉ) ඉහත (අ) හා (ආ) වගන්ති යටතේ පත් කරනු ලබන පාලක මණ්ඩල සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකයන් නියම කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ඇත. ඒ පාරිශ්‍රමිකය හා ඒ සමිතියේ කළමනාකාරිත්වයෙහි ලා දරන්නට සිදුවන වෙනත් වියදම් වෙතොත් ඒවා ද එකී සමිතියේ අරමුදල් වලින් දැරිය යුතු ය.

(ඊ) ඉහත (අ) හා (ආ) උපවගන්ති යටතේ පත් කරනු ලබන පාලක මණ්ඩල සාමාජිකයින්ට මෙම ප්‍රඥප්තියේ 48(1)(උ) සහ (එ) වගන්තිවල විධිවිධාන අදාල වන්නේ ය.

(උ) මෙම ප්‍රඥප්තියේ 48 වැනි වගන්තිය යටතේ පත් කරනු ලැබූ තැනැත්තන් රජයේ නිලධාරීන් වන අවස්ථාවක ලියාපදිංචි සමිතියක පාලන කටයුතු වල වංචාවක් හෝ අදාළ සමිතියට මූල්‍යමය පාඩුවක් සිදු කෙරෙන යම් අක්‍රමිකතාවක් සිදු වූ කල විගණනයකින් හෝ පරීක්ෂණයකින් පසු ඔවුන් සම්බන්ධ සියළු කටයුතු ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව සිදුවිය යුතු ය.

සමාලෝචන මණ්ඩලය පිහිටුවීම

(5) (අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 48(1)(අ) ඡේදය යටතේ සමූපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කර ඇති චෝදනා පත්‍රවලට ලැබෙන පිළිතුරු සමාලෝචනය කිරීම පිණිස සමාලෝචන මණ්ඩලයක් මෙයින් පිහිටුවනු ලැබේ.

සමාලෝචන මණ්ඩලයේ සාමාජිකයින්

(ආ) එම සමාලෝචන මණ්ඩලයට සාමාජිකයින් සමූපකාර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රධාන ලේකම්වරයාගේ ද උපදෙස් මත පත්කළ යුතු අතර එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය ඃ

(i) බස්නාහිර පළාතේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය හෝ සහකාර කොමසාරිස්වරයෙකු ;

(ii) බස්නාහිර පළාතේ සමූපකාර අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරියකු ;

(iii) සමූපකාර විෂය පිළිබඳ නිපුණත්වයක් ඇති විශ්‍රාමික රජයේ මාණ්ඩලික නිලධාරියකු.

සමාලෝචන මණ්ඩලයේ සභාපතිවරයා

(ඇ) සමාලෝචන මණ්ඩලයේ සභාපතිවරයා එහි සාමාජිකයින් අතරින් සමූපකාර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කෙරේ.

(ඈ) සමාලෝචන මණ්ඩලයේ ගණපූරණය සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත වන්නේ ය. සමාලෝචන මණ්ඩලයට සහභාගී වන සංඛ්‍යාව දෙදෙනෙක් වේ නම් තීරණයක් සම්බන්ධයෙන් බෙදීමක් පවතී නම් පූර්ණ සමාලෝචන මණ්ඩලය රැස්වී බහුතර තීරණ අනුව නිර්දේශය ලබාදිය යුතු ය.

(ඉ) සමාලෝචන මණ්ඩලයේ සාමාජිකයින්ගේ ධූර කාලය වසර 03ක් වන අතර සමූපකාර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සමාලෝචන මණ්ඩලයේ සාමාජිකයෙකු ඉහත (ඈ) උප වගන්තිය යටතේ ධූරයෙන් ඉවත් කරනු ලැබුවේ නම් මිස නැවත සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීමට සුදුස්සෙකු වන්නේ ය.

(ඊ) (ආ) වගන්තිය යටතේ පත්කළ සාමාජිකයෙකු ඉල්ලා අස්වීමෙන් හෝ මිය යාමෙන් හෝ ලේකම්වරයා විසින් සෑහීමකට පත්වීම මත එකී සාමාජිකයා ඉවත් කිරීමෙන් හෝ අදාළ ධූරය හිස් වුවහොත් මිස වසර 03ක කාලයකට එකී සාමාජිකයා එම ධූරය දරන්නේ ය.

(උ) ප්‍රධාන ප්‍රඥප්තියේ 48(5)(ඊ) වගන්තියට පසුව (උ) ලෙස නව වගන්තියක් ඇතුළත් කරන ලද අතර එම වගන්තිය 27(5)(උ) වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

සමාලෝචන මණ්ඩලයේ පාරිශ්‍රමිකයන් අදාල විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වරයා විසින් තීරණය කළ යුතු අතර එය සමූපකාර අරමුදලින් දැරිය යුතු ය.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 49(4) වැනි උපවගන්තියේ සමිතියක ලියාපදිංචිය .... යන වචන වල සිට .... රෙජිස්ට්‍රාර් විසින් පත්කළ හැකිය" යන වචන දක්වා වූ වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන නව විධිවිධානය ඇතුළත් කිරීමෙන් ඒ උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ ෑ

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වැනි වගන්තිය සංශෝධනය කිරීම

"එසේ පත් කරනු ලබන තැනැත්තා හෝ තැතැන්තන් රාජ්‍ය සේවකයකු විය යුතු ය."

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වැනි වගන්තියේ "49 වැනි වගන්තිය හෝ .....යන වචනවල සිට ..... රෙජිස්ට්‍රාර් විසින් පත්කළ හැකිය" යන වචන දක්වා වූ වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන නව විධිවිධානය ඇතුළත් කිරීමෙන් ඒ උප වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ ෑ-

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වැනි වගන්තිය සංශෝධනය කිරීම

"එසේ පත් කරනු ලබන තැනැත්තා හෝ තැනැත්තන් රාජ්‍ය සේවකයන් විය යුතු ය. තව ද එකී පත්වීම යටතේ එකී අය විසින් ඇවරකරු විසින් කරනු ලබන කාර්යය රාජ්‍ය සේවකයෙකු විසින් ඉටු කරනු ලබන කාර්යයක් ලෙසම සැලකිය යුතු ය.

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ ෑ-

ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වැනි වගන්තිය සංශෝධනය කිරීම

(1) ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වැනි වගන්තියේ (1)(ඉ) ඡේදයෙහි "පද්ගලයන් " යන වචනය වෙනුවට "පුද්ගලයන් " යන වචනය ආදේශ කිරීමෙන් ඒ ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වැනි වගන්තියේ (1)(ඌ) ඡේදයෙහි "රැස්වීම" යන වචනය වෙනුවට " රැස්වීම්" යන වචනය ආදේශ කිරීමෙන් ඒ ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ ෑ-

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වැනි වගන්තිය සංශෝධනය කිරීම

(1) ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වැනි වගන්තියේ (1)(ඌ) වැනි ඡේදයේ "(53)(1)(ඇ)" වෙනුවට "(53)(1)(ඈ) යන වචන ආදේශ කිරීමෙන් ඒ ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ ෑ

ඇවර ගිණුම යනුවෙන් හැඳින්වෙන ගිණුමක් පිහිටුවනු ලැබිය යුතු අතර, ඇවරකරුවන් විසින් රැස්කරනු ලබන සියලු මුදල් ඒ ගිණුමට බැර කළ යුතු ය. තව ද එකී ගිණුම රීති වලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා විසින් ක්‍රියාත්මක කළ යුතු ය. තව ද එකී අරමුදල වාර්ෂිකව විගණනය කර පළාත් සභාවට ගිණුම් ඉදිරිපත් කිරීම රෙජිස්ට්‍රාර්වරයාගේ වගකීම වන්නේ ය.

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 57(3) උපවගන්තියෙහි "එසේ තැන්පත් කළ අතිරික්තය මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා ...රෙජිස්ට්‍රාර්ගේ අභිමතය පරිදි කළ හැකිය" යන වගන්තියේ අතිරික්ත අරමුදල වෙනුවට "අතිරික්ත ගිණුමකට, ලෙස ආදේශ කිරීමෙන් එම උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වැනි වගන්තිය සංශෝධනය කිරීම

33. ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වැනි වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ ෑ-

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වැනි වගන්තිය සංශෝධනය කිරීම

(1) "සාමාජිකයන්, හිටපු සාමාජිකයන් සහ සාමාජිකයන්, හිටපු සාමාජිකයන් හා මියගිය සාමාජිකයන් මගින් හිමිකම් කියාපාන තැනැත්තන් අතර, හෝ සමිතියේ අතීත හෝ වර්තමාන නිලධාරීන් හෝ සේවකයන් අතර, හෝ මිය ගිය නිලධාරීන්ගේ හෝ සේවකයන්ගේ උරුමකරුවන් හෝ නීත්‍යානුකූල නියෝජිත අතර, හෝ "

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වැනි වගන්තියේ (1)(ඈ) ඡේදයේ "සමිතියේ " යන වචනය වෙනුවට "සමිතිය" යන වචනය ආදේශ කිරීමෙන් ඒ ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(3) ප්‍රධාන ප්‍රඥප්තියේ 58(2)(ආ) ඡේදයෙහි "බේරුම්කරුවෙකු " යන වචනයට පසුව "/තීරකවරයෙකු" යන වචනය ද "බේරුම්කරුවන් " යන වචනයට පසුව "/තීරකවරුන් " යන වචනය ද එක් කිරීමෙන් එම ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(4) ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වැනි වගන්තියේ (2)(ආ) ඡේදයට ඉක්බිතිව පහත සඳහන් නව විධිවිධානය ආදේශ කිරීමෙන් ඒ ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

"එසේ පත් කරනු ලබන තැනැත්තා හෝ තැනැත්තන් රාජ්‍ය සේවකයන් විය යුතු ය ".

(5) (i) ප්‍රධාන ප්‍රඥප්තියේ 58(3) උපවගන්තියේ "බේරුම්කරුවකුගේ " යන වචනයට පසුව "තීරකවරයෙකුගේ " යන වචනය ද "බේරුම්කරුවන්ගේ "යන වචනයට පසුව "/තීරකවරුන්ගේ " යන වචනය ද එක් කිරීමෙන් එම උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(ii) ප්‍රධාන ප්‍රඥප්තියේ 58(3) වැනි උපවගන්තියෙහි (සති අන්ත නිවාඩු දිනයන් හැර) යන වචන එකී වරහන් සමඟ ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(iii) ප්‍රධාන ප්‍රඥප්තියේ 58(3) උපවගන්තියේ "තව ද තීන්දුව .... ලද්දේ යම් පාර්ශවයකට ද" යන වචන අතර ඇති "දෙල" යන වචනය වෙනුවට "දෙන" යන වචනය හා "ඉල්ලා පාර්ශවකරුවෙකු " යන වචන අතර ඇති "සිටින" යන වචනය වෙනුවට "සිටි" යන වචනය ආදේශ කිරීමෙන් ඒ උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(6) ප්‍රධාන ප්‍රඥප්තියේ 58(6) වන උපවගන්තියෙහි "බේරුම්කරුවකුගේ " යන වචනයට පසුව, " /තීරකවරයෙකුගේ " යන වචනය ද, "බේරුම්කරුවන්ගේ " යන වචනයට පසුව "/තීරකවරුන්ගේ " යන වචනය ද එක් කිරීමෙන් එම උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වැනි වගන්තිය සංශෝධනය කිරීම

34.ප්‍රධාන ප්‍රඥප්තියේ 59(1) උපවගන්තියෙහි "බේරුම්කරුවකුගේ " යන වචනයට පසුව, "/තීරකවරයෙකුගේ" යන වචනය එක් කිරීමෙන් එම උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වැනි වගන්තිය සංශෝධනය කිරීම

35. ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වැනි වගන්තියට 60(03)(අ), 60(03)(ආ) සහ 60(04) ලෙස පහත නව වගන්ති පිළිවෙලින් ඇතුළත් කරමින් එකී වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(අ) සෑම ලියාපදිංචි කළ සමිතියක්ම වර්ෂ තුනක් ඉක්ම යාමට පෙර කාරක සභා නිලවරණ පවත්වා කාරක සභිකයන් තෝරා පත් කර ගත යුතු ය.

එසේ වුව ද යම් විශේෂ හේතුවක් මත වර්ෂ තුන (03)ක් ඇතුළත කාරක සභාව තෝරා පත් කර ගැනීමට සමිතිය අපොහොසත් වුවහොත් මාස 03ක කාලයක් සඳහා පමණක් කාරක සභාවේ නිල කාලය දීර්ඝ කිරීමට කොමසාරිස්වරයාට බලය ඇති වන්නේ ය. මාස තුනක කාලය තුළ නිළවරණය පැවැත්වීමට නොහැකි වුවහොත් කොමසාරිස්වරයා විසින් තිදෙනෙකුගෙන් යුත් පාලක මණ්ඩලයක් පත් කළ යුතු ය. එසේ පත් කරන නිලධාරීන් රාජ්‍ය නිලධාරීන් විය යුතු අතර ඔවුන්ගේ නිල කාලය වසරකට සීමා විය යුතු ය."

(ආ) ලියාපදිංචි කළ සමිතියක මහා සභාවක් ස්ථාපිත කිරීම සඳහා බාධා වන යම් අතුරු ව්‍යවස්ථා විධිවිධාන වෙතොත් අදාල විධිවිධාන වලින් නිදහස් කර මහ සභාව සංස්ථාපනය කිරීමට අවශ්‍ය නියමයන් කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය තිබිය යුතු ය.

(4) 1. තව ද, ඉහත (3) උපවගන්තිය යටතේ කටයුතු කිරීමෙන් පසුව අවශ්‍ය වන්නේ නම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන කාලයක් ඇතුළත මහ සභාවක් ස්ථාපනය කළ යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වැනි වගන්තිය සංශෝධනය කිරීම

36. ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වැනි වගන්තිය ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරන අතර එම වගන්තිය 61 වැනි වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :-

(1) මේ ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සියලු රීති පළාත් සභාවේ සමුපකාර විෂයයභාර අමාත්‍යවරයා විසින් සෑදිය හැකිය.

(2)විශේෂයෙන්ම හා (1) වැනි උපවගන්තියෙන් පැවැරුණු බලතලවල සාමාන්‍යත්වයට හානියක් නොමැතිව ඒ රීතිවලින් :-

(අ) සමිතියක් ලියාපදිංචි කිරිම සඳහා ඉල්ලුම් කිරීමේ දී අනුගමනය කළ යුතු කොන්දේසි හා ඒ ඉල්ලුම් කිරීම පිළිබඳ කාර්යය පටිපාටිය නියම කළ හැකි ය.

(ආ) සාමාජිකයන් වශයෙන් ඇතුළත් වීම සඳහා ඉල්ලුම්කරන හෝ සාමාජිකයින් වශයෙන් ඇතුළත් කරගනු ලැබූ තැනැත්තන් විසින් අනුගමනය කළ යුතු කොන්දේසි නියම කළ හැකි අතර, කලින් කල සාමාජිකයන් තෝරා පත්කර ගැනීම හා ඇතුළු කර ගැනීම හා සාමාජිකත්වයේ අයිතිවාසිකම් පාවිච්චි කිරීමට පෙර කළ යුතු ගෙවීම් හා ලබා ගත යුතු සම්බන්ධතා සඳහා සහ අතුරු ව්‍යවස්ථා කඩ කිරීම සම්බන්ධයෙන් සාමාජිකයින්ට දඩ නියම කිරීම සඳහා ද විධිවිධාන සැලැස්විය හැකි ය.

(ඇ) සාමාජිකයන් ඉල්ලා අස්වීම හා නෙරපීම සඳහා ද ඉල්ලා අස්වන හෝ නෙරපනු ලබන සාමාජිකයන්ට කළ යුතු ගෙවීම් සඳහා ද හිටපු සාමාජිකයන්ගේ වගකීම් සඳහා ද විධිවිධාන සැලැස්විය හැකි ය.

(ඈ) ලියාපදිංචි කළ සමිතියක සාමාජික සංඛ්‍යාව ඒ සමිතිය විසින් සීමා කළ හැකි ප්‍රමාණය නියම කළ හැකි ය.

(ඉ) මියගිය සාමාජිකයෙකුගේ සම්බන්ධතාවයේ වටිනාකම නිශ්චය කළ යුතු ආකාරය සඳහා ද ඒ සම්බන්ධතාවයේ වටිනාකම ගෙවිය හැකි හෝ පැවරිය හැකි තැනැත්තෙකු නම් කිරීම සඳහා ද විධිවිධාන සැලැස්විය හැකි ය.

(ඊ) 11 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, සාමාජිකයෙක් සතුව තිබිය හැකි ලියාපදිංචි කළ සමිතියක ප්‍රාග්ධනයේ වැඩිම කොටස් ගණන හෝ පංගුව නියම කළ හැකි ය.

(උ) ණය හෝ මුදල් ණයවර සඳහා ඉල්ලුම් කරන සාමාජිකයින් විසින් කළ යුතු ගෙවීම්, අනුගමනය කළ යුතු කොන්දේසි හා ලියා අත්සන් කළ යුතු බැඳුම්කරවල, නීත්‍යානුකූල ලේඛනවල හෝ වෙනත් ලේඛනවල ආකෘති, දිය හැකි ණය වල හෝ ප්‍රදානය කළ හැකි ණයවරවල කාලසීමාව, තනි සාමාජිකයින්ට පනවනු ලැබිය හැකි උපරිම මුදල හා ඔවුන් සම්බන්ධයෙන් ඉඩදෙනු ලැබිය හැකි වැඩිම ණයවර නියම කළ හැකි ය.

(ඌ) ලියාපදිංචි සමිතියක සාමාජිකයින්ට ලාභ බෙදා දිය හැක්කේ යම් කොන්දේසිවලට යටත්ව ද, ඒ කොන්දේසි හා සමිති විසින් ගෙවිය හැකි ලාභාංශ පිළිබඳව උපරිම ප්‍රමාණය නියම කළ හැකි ය.

(එ) කොටස් මගින් හෝ සෘණ පත්‍ර මගින් හෝ වෙනයම් ආකාරයකින් අරමුදල් ලබාගත හැකි ආකාරය හා තැන්පතු සම්බන්ධයෙන් ගෙවිය හැකි පොලී ප්‍රමාණය විධිමත් කළ හැකිය.

(ඒ) සාමාජිකයන්ගේ මහා සභා රැස්වීම සඳහා ද ඒ රැස්වීම්වල කාර්යය පරිපාටිය සඳහා ද රැස්වීම්වල දී පාවිච්චි කළ යුතු බලතල සඳහා ද විධිවිධාන සැලැස්විය හැකි ය.

(ඔ) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයකු, කළමනාකරණ කාරක සභාවේ හෝ ප්‍රාදේශීය හෝ ශාඛා කාරක සභාවක සාමාජිකයෙකු ලෙස තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් වූ නුසුදුසුකම් නියම කිරීම

(ඕ) කාරක සභාවල සාමාජිකයන් හා වෙනත් නිලධාරීන් පත්කිරීම, ඔවුන්ගේ සේවය අත්හිටුවීම හා ඔවුන් ඉවත් කිරීම සඳහා ද කාරක සභා රැස්වීම්වල කාර්යය පරිපාටිය සඳහා ද කාරක සභාව හා වෙනත් නිලධරයන් විසින් පාවිච්චි කළ යුතු බලතල හා ඉටුකළ යුතු යුතුකම් සඳහා ද විධිවිධාන සැලැස්විය හැකි ය.

(ක) සමිතියක් විසින් අතුරු ව්‍යවස්ථා සෑදිය හැකි හෝ සෑදිය යුතු කරුණු සහ අතුරු ව්‍යවස්ථා සෑදීමේදී, වෙනස් කිරීමේ දී හා පරිච්ඡින්න කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්යය පරිපාටිය ඒ අතුරු ව්‍යවස්ථා පැනවීමට, වෙනස් කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට පෙර සපුරාලිය යුතු කොන්දේසි නියම කළ හැකි ය.

(ග) ලියාපදිංචි කළ හැකි සමිතියක් විසින් හෝ ලියාපදිංචි කළ සමිතියක් විසින් හෝ ගිණුම් තැබීම, පොත් පත් තබා ගැනීම, මූල්‍ය වාර්තා සැකසීම සම්බන්ධයෙන් එම සමිතියේ වත්කම් හා බැරකම් පෙන්නුම් කරන ශේෂ පත්‍රයක් කලින් කල පළ කිරීමට අදාළ නියමයන් කළ හැකිය ;

(ජ) ලියාපදිංචි කළ සමිතිවල ගණන් විගණන කිරීම සඳහා සහ ඒ විගණනය සඳහා ගෙවිය යුතු යම් ගාස්තු ඇතොත් ඒ ගාස්තු ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම ද, පවත්නා සමිති විගණනය කිරීම, ඒවා පරිපාලනය කිරීම සහ ඒවාට සහාය දීම සඳහා ද සමුපකාර ප්‍රචාරක කටයුතු සඳහා ද සමුපකාර අධ්‍යාපනය හා පුහුණුව සඳහා ද පාවිච්චි කිරීම පිණිස සමුපකාර අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලකට සියලුම ලියාපදිංචි කළ සමිතිවලින් හෝ එවැනි යම් සමිතිවලින් දායක මුදල් අය කිරීමට විධිවිධාන සැලැස්වීම ද ඒ අරමුදල් පරිපාලනය සඳහා විධිවිධාන සැලැස්වීම ද කළ හැකිය ;

(ට) ලියාපදිංචි කරන ලද සමිති විසින් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු වාර වාර්තා සහ ඒ වාර වාර්තා ඉදිරිපත් කළ යුතු නැතැත්තන් හා ආකාරය නියම කළ හැකිය ;

(ඩ) ලියාපදිංචි කළ සමිති සතු පොත්වල ඇතුළත් ව ඇති සටහන්වල පිටපත් සහතික කළ හැකි තැනැත්තන් හා ආකාරය සඳහා විධිවිධාන සැලැස්විය හැකිය ;

(ණ) සාමාජිකයන්ගේ නාමලේඛනයක් සහ සාමාජිකයන්ගේ වගකීම් කොටස්වලින් සීමාසහිත වූ අවස්ථාවක කොටස් පිළිබඳ නාම ලේඛනයක් සකස් කොට පවත්වා ගෙන යාම සඳහා ද විධිවිධාන සැලැස්විය හැකිය ;

(ත) සංචිත අරමුදල් ඇතිකොට පවත්වාගෙන යාම හා ඒ අරමුදල් යෙදිය හැකි පරමාර්ථ සඳහා ද ලියාපදිංචි කළ සමිතියක පාලනය යටතේ ඇති යම් අරමුදල් ආයෝජනය කිරීම සඳහා ද විධිවිධාන සැලැස්විය හැකිය ;

(ද) සමිතියක් වෙත හෝ ඒ මාර්ගයෙන් ද්‍රව්‍ය විකිණීමට අදාළ යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ ගිවිසුමක් කඩකිරීමක් පිළිබඳ ;

යම් ප්‍රශ්නයක් නිශ්චය කළ හැකි ආකාරය හා එබඳු යම් කඩ කිරීමක් නිසා වූ ප්‍රමාණ කළ අලාභය නිශ්චය කළ හැකි හෝ තක්සේරු කළ හැකි ආකාරය නියම කළ හැකිය ;

(න) 48(5) උපවගන්තිය යටතේ පිහිටුවනු ලබන සමාලෝචන මණ්ඩලය සම්බන්ධයෙන් රීති සකස් කළ හැක ;

(ප) බේරුම්කරුවෙකු/තීරකවරයෙකු හෝ බේරුම්කරුවන්/තීරකවරුන් පත් කිරීමේ ක්‍රමය හා රෙජිස්ට්‍රාර් හෝ ඒ බේරුම්කරු/තීරකවරයා හෝ බේරුම්කරුවන්/තීරකවරුන් ඉදිරියෙහි පැවැත්වෙන කෘත්‍යයන්හි දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හා රෙජිස්ට්‍රාර්ගේ තීරණය හෝ බේරුම්කරුවන්ගේ/ තීරකවරුන්ගේ තීන්දු ක්‍රියාත්මක කළ යුතු ආකාරය නියම කළ හැකිය ;

(බ) මධ්‍යම රජයෙන් හෝ පළාත් සභාවෙන් මුදල් ආධාර සඳහා ඉල්ලුම් කරන ලියාපදිංචි කළ සමිතියක් විසින් පිළිපැදිය යුතු කොන්දේසි නියම කළ හැකිය ;

(ම) රෙජිස්ට්‍රාර් විසින් කරන ලද නියෝගවලට විරුද්ධව අමාත්‍යවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අවස්ථාවල දී ඒ පිළිබඳව රීති සෑදිය හැකිය ;

(ය) 52 වැනි වගන්තිය යටතේ පත්කරනු ලැබූ ඇවරකරුවෙකු විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හා ඒ බේරුම්කරුගේ නියෝගවලට විරුද්ධව ආයාචනා ඉදිරිපත් කළ හැකි විය යුතු අවස්ථා නියම කළ හැකිය ;

(ර) 54(2) උපවගන්තියෙහි සඳහන් ඇවර ගිණුම හා 57 (3) උපවගන්තියෙහි සඳහන් අතිරික්ත ගිණුම නමින් වූ ගිණුමක් පිහිටුවීම හා පවත්වාගෙන යෑම සඳහා විධිවිධාන සැලැස්වීම සහ එම ගිණුම්වල මුදල්, වියදම් කළ හැකි ආකාරය හා කාර්යයන් නියම කිරීම ;

(ල) මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ රීති යටතේ ආයාචනා ඉදිරිපත් කිරීම, ඇසීම හා ඒ පිළිබඳ සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් පාවිච්චි කළ යුතු ආකෘති, ගෙවිය යුතු ගාස්තු, පිළිපැදිය යුතු කාර්ය පරිපාටිය හා ඒවාට සම්බන්ධ හෝ ආනුෂාංගික වෙනත් සියලු කරුණු නියම කිරීම කළ හැකිය ;

(ව) ලියාපදිංචි කළ සමුපකාර සමිති පරිපාලනය කිරීම සඳහා සාමාන්‍ය පරීක්ෂණයක් හා/හෝ හදිසි පරීක්ෂණයක් සිදු කිරීම හෝ තමන් විසින් බලය පවරනු ලැබූ තැනැත්තෙකු ලවා සිදුකරවා ගැනීමට රෙජිස්ට්‍රාර්වරයාට බලය ලැබෙන විධිවිධාන සැලැස්විය හැකිය ;

(3) පළාත් සභාව විසින් අනුමත කරනු ලැබුවේ නම් මිසක කිසිම රීතියක් බලනොපැවැත්විය යුතු ය. ඒ අනුමැතිය පිළිබඳ නිවේදනය සහ රීති ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

(4) (3) වැනි උපවගන්තියෙන් නියමිත නිවේදනය ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් පසු සෑම රීතියක්ම මෙහි පනවනු ලැබුවාක් මෙන් වලංගු හා බලසහිත විය යුතුය.

37. ප්‍රධාන ප්‍රඥප්තියේ 65(1) වැනි උප වගන්තියෙහි "අයිතිකිය" යන වචනය වෙනුවට "අයිත්කිය" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වැනි වගන්තිය සංශෝධනය කිරීම

38. ප්‍රධාන ප්‍රඥප්තියේ 66(1) වැනි උප වගන්තියෙහි "වෙනත් පනතක" යන වචනය වෙනුවට "වෙනත් පනතක හෝ ප්‍රඥප්තියක" වන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වැනි වගන්තිය සංශෝධනය කිරීම

39. ප්‍රධාන ප්‍රඥප්තියේ 67(1) වැනි උපවගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන නව විධිවිධාන ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වැනි වගන්තිය සංශෝධනය කිරීම

"එසේ වුවද, ලියාපදිංචි පාසල් සමුපකාර සමිති සම්බන්ධයෙන් වූ කළ, ඉහත (1) උපවගන්තියේ විධිවිධාන අදාල නොවිය යුතු ය." ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වැනි වගන්තිය සංශෝධනය කිරීම

40. ප්‍රධාන ප්‍රඥප්තියේ 72(2) උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට නව උපවගන්තියක් ආදේශ කිරීමෙන් ද 72(3) වගන්තියට ඉක්බිතිව 72(4) ලෙස නව උපවගන්තියක් ඇතුළත් කිරීමෙන් ද එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"(2) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමේදී මේ දක්වා ක්‍රියාත්මක වූ 1992 අංක 11 හා 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත සමඟ කියැවෙන 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ හෝ එම පනත් මගින් අවලංගු කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ හෝ සාදනු ලැබ, මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ බල පවත්නා ලද 1973 සමුපකාර සමිති රීති මාලාව, එකී රීති මාලාවේ විධිවිධාන මෙම ප්‍රඥප්තියේ 61 වැනි වගන්තිය යටතේ අලුතින් රීති සාදා පනවනු ලබන තෙක් එකී රීති අඛණ්ඩව බලපැවැත්විය යුතු ය.

"(4) (අ) ලියාපදිංචි කළ සෑම සමිතියක් ම-

(i) ලියාපදිංචි කරනු ලැබූ සමිතියක් විසින් හෝ වෙනුවෙන් හෝ ඒ සමිතියේ වාසියට ලියා අත්සන් කරනු ලබන යම් නීත්‍යානුකූල ලේඛනයක් සම්බන්ධයෙන් හෝ 59 වැනි වගන්තියේ විධිවිධාන අනුව අධිකරණයකට ඉදිරිපත් කරනු ලබන යම් ලේඛනයක් සම්බන්ධයෙන් මේ උප වගන්තිය මගින් නිදහස් කිරීම නිසා නොවේ නම් අය කෙරෙන ගාස්තුව ගෙවීමට ඒ සමිතිය යටත් විය හැකි අවස්ථාවලදී ඒ නීත්‍යානුකූල ලේඛනය හෝ අන් ලේඛනය සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් යටතේ අයකරනු ලැබිය හැකි යම් මුද්දර ගාස්තුවකින්, හා

(ii) ලේඛන ලියාපදිංචි කිරීමට අදාළව තත්කාලයෙහි බලපවත්නා නීතිය යටතේ ගෙවිය යුතු යම් ගාස්තුවලින් නිදහස් විය යුතු ය.

(ආ) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකු විසින් ඒ ලියාපදිංචි කළ සමිතියේ වාසියට සහ ඒ සමිතියේ ව්‍යාපාර කටයුතු වලට අදාළව ලියා අත්සන් කරනු ලබන යම් නීත්‍යානුකූල ලේඛනයක් සම්බන්ධයෙන්, මේ උපවගන්තිය මගින් නිදහස් කිරීම නිසා නොවේ නම් අය කරන ගාස්තුව ගෙවීමට ඒ සාමාජිකයා යටත් විය හැකි අවස්ථාවලදී ඒ නීත්‍යානුකූල ලේඛනය සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් යටතේ අයකරනු ලැබිය හැකි යම් මුද්දර ගාස්තුවක් ගෙවීමෙන් ඒ සෑම සාමාජිකයෙක් ම නිදහස් විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වැනි වගන්තිය සංශෝධනය කිරීම

41. ප්‍රධාන ප්‍රඥප්තියේ 74(1) වැනි උපවගන්තියෙහි "ඒ වෙනුවෙන් යථා පරිදි පවරනු ලැබූ අන් තැනැත්තෙකු" යන වචන වෙනුවට "ඒ වෙනුවෙන් යථා පරිදි බලය පවරනු ලැබූ අන් තැනැත්තෙකු " යන වචන ආදේශ කිරීමෙන් එම උපවගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වැනි වගන්තිය සංශෝධනය කිරීම

42. ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වැනි වගන්තියේ (i), (ii) හා (iii), වැනි උප වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන නව වගන්ති ආදේශ කිරීමෙන් සහ එම නව වගන්ති පිළිවෙලින් 76(1), (2), (3) උප වගන්ති ලෙස නැවත අනු අංක කිරීමෙන් ද එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ ඃ

(1) (අ) රෙජිස්ට්‍රාර්ට ද, සාමාන්‍ය හෝ විශේෂ නියෝගයකින් ඔහුගෙන් ඒ සඳහා ලිඛිත බලයලත් කෙනෙකුට ද, ඕනෑම අවස්ථාවක දී තමා නියම කරන අයුරු, නියම කරන වේලාවක දී හා ස්ථානයක දී සෑම ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක විශේෂ මහ සභා රැස්වීමක් හෝ එකී සමිතියක ඕනෑම ප්‍රාදේශික මහා සභාවක විශේෂ රැස්වීමක් කැඳවීමට බලය ඇති වේ. එවැනි රැස්වීමක දී මහ සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා සමිතියේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවට අනුව ඒ ඒ මහා සභා රැස්වීමකට සහභාගිවීමට බලයලත් සාමාජිකයන්ගෙන්/ නියෝජිතයන්ගෙන් ගණ පූරණය සියයට දහයකට නොඅඩු විය යුතු ය. තවද එවැනි මහා සභා රැස්වීමකට හෝ ප්‍රදේශික මහා සභා රැස්වීමකට ඒ සමිතියේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවෙන් ඒ ඒ මහ සභාවට නිශ්චිතව හිමිකර ඇති සියලුම බලතල හිමිවන්නේ ය.

(ආ) රෙජිස්ට්‍රාර්ට ද ඔහුගෙන් ඒ සඳහා ලිඛිතව බලයලත් කෙනෙකුට ද, ඕනෑම ලියාපදිංචි සමුපකාර සමිතියක විශේෂ කාරක සභා රැස්වීමක් හෝ එකී සමිතියක ඕනෑම ප්‍රාදේශික කාරක සභාවක විශේෂ රැස්වීමක් ඕනෑම අවස්ථාවක දී තමන් නියම කරන අයුරින් නියම කරන වේලාවක දී හා ස්ථානයක දී කැඳවීමට බලය ඇති වේ. ඒ සමිතියේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවෙන් කාරක සභා හෝ ප්‍රදේශික කාරක සභා හෝ රැස්වීමකට පැමිණ සිටීමට බලය ලත් සංඛ්‍යාවෙන් ඉහත කී විශේෂ කාරක සභා රැස්වීමක ගණ පූරණය 20%ට නොඅඩු විය යුතු ය. සමිතියේ ලියාපදිංචි අතුරු ව්‍යවස්ථාවේ ඒ ඒ කාරක සභාවකට නිශ්චිතව හිමිකර ඇති සියලු බලතල ඉහත කී විශේෂ කාරක සභා හෝ ප්‍රාදේශික කාරක සභා රැස්වීමකට ද හිමිවන්නේ ය.

(ඇ) රෙජිස්ට්‍රාර් විසින් හෝ ඔහුගේ බලයලත් තැනැත්තෙකු විසින් හෝ ඉහත (1) උපවගන්තිය යටතේ විශේෂ මහ සභා රැස්වීමක් හෝ ඉහත (2) උපවගන්තිය යටතේ විශේෂ කාරක සභා රැස්වීමක් හෝ තමාට වැටහෙන එකී සමිතියේ පොත්පත් හා ලියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට රෙජිස්ට්‍රාර්වරයා හෝ එසේ බලයලත් තැනැත්තෙකුට හෝ බලය පැවරේ. එවැනි සෑම නියෝගයක්ම අනුව ක්‍රියා කිරීම එකී පොත්පත් භාරව සිටින තැනැත්තා හෝ එම නියෝගය ලබන සමිතියේ ඕනෑම නිලධාරියෙකුගේ යුතුකම වේ.

රෙජිස්ට්‍රාර්ට හෝ ඔහුගේ බලයලත් තැනැත්තාට හෝ ඉහත (1) හා (2) වැනි උප වගන්ති යටතේ කැඳවන ලද සෑම රැස්වීමකම මුලසුන දැරිය හැකිය. ඒ අයට එකී රැස්වීමේ න්‍යාය පත්‍රයේ සඳහන් කරුණු තීරණය කිරීමට අදාළව සාමාන්‍ය ඡන්ද බලය හිමි නොවිය යුතු ය.

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 76(iv) උපවගන්තිය 76(4) උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වැනි වගන්තිය සංශෝධනය කිරීම

43. ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වැනි වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ ඃ

(1) ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වැනි වගන්තියේ "මූලික සමිතිය", "අමාත්‍යවරයා", "රජයේ අරමුදල් " යනුවෙන් දක්වා ඇති අර්ථ නිරූපනයන් පහත දැක්වෙන ලෙස සංශෝධනය කරනු ලබන අතර "පළාත් සභාව", "ප්‍රඥප්තිය", "ආශ්‍රිත සාමාජිකයා" සහ "නියෝජ්‍ය, ජ්‍යෙෂ්ඨ සහකාර හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරයෙකු "යන්නෙන් නව අර්ථ නිරූපන වගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"මූලික සමිතිය" යන්නෙන් 3(1) උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් අරමුණක් ඇතිව හෝ යම් කාර්යයක් සඳහා පිහිටුවන ලද (ලියාපදිංචි සමිති සාමාජිකයින් වශයෙන් ඇති) සමිතියක් නොවන, ලියාපදිංචි කළ සමිතියක් අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් බස්නාහිර පළාත් සභාවේ සමුපකාර සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් කටයුතු කිරීමට තත්කාලයේ පත් කරනු ලැබ සිටින තැනැත්තා අදහස් කෙරේ.

"රජයේ අරමුදල් "යන්නෙන් රජයේ හෝ බස්නාහිර පළාත් සභාව හෝ විසින් මුදලින් හෝ භාණ්ඩවලින් හෝ දී ඇති හෝ දෙනු ලබන ණය, අත්තිකාරම් සහ ප්‍රදාන,

අදහස් වන අතර මෙම ප්‍රඥප්තියේ 42 වගන්තියේ විධානයන්ට අනුව සමුපකාර සමිති රීති යටතේ පිහිටුවනු ලබන හෝ ලැබ ඇතැයි සැලකෙන සමුපකාර අරමුදලින් හෝ මෙම ප්‍රඥප්තියේ 54 හා 57 වගන්ති යටතේ පිහිටුවනු ලබන අතිරික්ත අරමුදල යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් යම් ලියාපදිංචි සමිතියකට දී ඇති හෝ දෙනු ලබන හෝ යම් ණයක්, ප්‍රදානයක් හා අත්තිකාරමක් අදහස් වේ.

"පළාත් සභාව" යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කෙරේ.

"ප්‍රඥප්තිය" යන්නෙන් බස්නාහිර පළාත් සභාවේ 1998 අංක 03 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය අදහස් කෙරේ.

"ආශ්‍රිත සාමාජිකයා" යන්නෙන් ඡන්ද බලය රහිත කොටස් හිමි නොවන ගණුදෙනු කරුවෙක් අදහස් කෙරේ.

නියෝජ්‍ය, ජ්‍යෙෂ්ඨ සහකාර හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරයෙකු යන්නෙන් නියෝජ්‍ය කොමසාරිස්, ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස් හා සහකාර කොමසාරිස් යන තනතුරු අදහස් වේ.

"ආයතන සංග්‍රහය" යන්නෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත්කර ඇති ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි බාණ්ඩ අදහස් වේ.

44. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 78 වැනි වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :

මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

06-668

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.